# සයිබර් අවකාශය තුළ වින්දිතභාවයට පත්වීම



## අන්තර්ජාලය භාවිතයෙන් සිදුකරන ළමා ලිංගික සූරාකෑම් වලට ගොදුරු වූ වින්දිතයින් හඳුනා ගැනීම.

**අනතුරු අවදානමට ලක්වන්නේ කවුරුන්ද?**
පොළඹවා ගැනීමකට ලක්වීම සඳහා ඕනෑම දරුවෙකු කෙරෙහි ම අනතුරු අවදානමක් ඇත. පිරිමි ළමයින් සහ ගැහැනු ළමයින් යන දෙපාර්ශවයම ලිංගිකමය පොළඹවා ගැනීම්වලට නතුවිය හැකිබව මතක තබා ගැනීම වැදගත්ය.

අන්තර්ජාලය හරහා පෙළඹවීමට ලක්වන දරුවන් ඔවුන් හොඳින් දන්නා කෙනෙකු විසින් ද අපයෝජනයට ලක්කළ හැකිය. තවද ඔවුන්, අන්තර්ජාලය හරහා කෙටිකාලයක් අතරතුර හඳුනාගත් අයෙකු හෝ දිගු කාලයක් තිස්සේ ළමයා සමග සම්බන්ධතාවයක් ගොඩනගා ගෙන සිටින ආගන්තුක අයෙකු ද විය හැකිය.

විශේෂයෙන් ම, විවිධ ආබාධ සහිත හෝ නොසලකා හරින ලදුව හෝ රැකබලා ගැනීම සඳහා ආයතනගතකර ඇති දරුවන් පොළඹවා ගන්නන් ගේ ඉලක්කගත ගොදුරු බවට පත් විය හැකිය.

පොළඹවාගන්නෙකු දරුවෙකු හෝ යෞවනයෙකු කෙරෙහි පවතින ඕනෑම අවදානම් සහගත තත්ත්වයකින් අයුතු ප්‍රයෝජන ලබාගනිමින් ඔවුන් තමන් මත යැපීමට ඇති සම්භාවිතාවය වැඩි කර ගනී. එයින් ඔවුන් දරුවා හෝ යෞවනයා ඒ පිළිබඳව හෙළිදරව් කිරීමට ඇති ඉඩකඩ අඩුකර ගනී.

ළමයින් ලිංගික සූරාකෑම් වලට ලක්වීම බොහෝ අවස්ථාවල හඳුනා ගැනීමට අපහසුය. දරුවා අන්තර්ජාලය තුළ වින්දිතයෙක් බවට පත්ව සිටින බව ඔබට හඳුනා ගැනීම සඳහා උපකාර විය හැකි සංඥා කිහිපයක් පහත දැක්වේ.

**උපාංග භාවිතයෙහි ක්ෂණික වෙනස්කම් ඇති වීම** - දරුවා දුරකථනයෙහි හෝ පරිගණකයෙහි පෙරට වඩා වැඩි හෝ අඩු කාලයක් ගත කරයි නම් හෝ සම්පූර්ණයෙන්ම භාවිතයෙන් ඉවත්ව ඇත්නම් ඒ පිළිබඳව සාකච්ඡා කිරීම වැදගත් වෙයි.

**ගිණුම් මකා දැමීම** - සමාජ මාධ්‍ය ජාලා තුළින් ඇති වන කැළඹීම් නිසා බොහෝ තරුණ තරුණියන් තම ගිණුම මකා දැමීමට හෝ අක්‍රිය කිරීමට තීරණය කරයි. මෙය ඉතා වැදගත් සංඥාවක් ලෙස සැලකිය හැක. එයින් පැහැදිලි වන්නේ ඔවුන්ට හිංසනයන්ට මුහුණ දීමට නොහැකිව එම අවස්ථාවෙන් පලා යාමට උත්සාහ කරන බවයි. එනම් ඔවුන්ට සියලු සම්බන්ධතා අත්හැර දැමීමට තරම් ප්‍රබල බලපෑම් එල්ල වී ඇති බවයි.

**“අනෙක් අයව අවහිර කරන්නේ කෙසේද?” යන්න විමසීම** - දරුවා වෙනත් කෙනෙකු සමාජ මාධ්‍ය ජාලා තුළ අවහිර කරන්නේ කෙසේද යන්න ඔබෙන් විමසයි නම් ඒ පිළිබඳ වැඩිදුර සොයාබැලීම වැදගත් විය හැක.

**ස්වරූපයේ වෙනස්වීම** - දරුවා, ඔහුගේ පරිගණකය හෝ ජංගම දුරකථනය ක්‍රියා විරහිත කර දමන ආකාරය හා ඒවා භාවිතයෙන් ඉවත් කරන ආකාරය පිළිබඳව ඔබගේ අවධානය යොමු කරන්න. එමගින් ඔහු මුහුණපා ඇති තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයන් සපයනු ඇත.

**ආත්ම අභිමානය පහත වැටීම** - "ජීවිතය තේරුමක් නෑ", "මට එපා වෙලා", "මිනිස්සු මහ එපා කරපු ජාතියක්" වැනි අදහස් දැක්වීමෙන් සියලු දේ කෙරෙහි අප්‍රසාදයෙන් සිටීම දරුවා අන්තර්ජාලය තුළ අපහසුතාවකට ලක්වන බව පෙන්වන ප්‍රබල ප්‍රකාශයන් වේ. "මොකක් ද වෙලා තියෙන්නෙ කියලා මට කියන්න" යන්න එවැනි ඕනෑම ගැටලුවකට ඉතා හොඳ ප්‍රතිචාරයකි.

**කායික වෙනස්කම්** - ආහාර චර්යාවේ වෙනස්කම්, නින්දෙහි අක්‍රමිකතා දරුවා අන්තර්ජාලය භාවිතයෙන් සිදුකරන ළමා ලිංගික සූරාකෑම් වලට ලක්වී ඇතැයි සැලකීමට හේතුන් වේ. ඔවුන්ගේ පරිගණක හෝ ජංගම දුරකථන වෙනත් කෙනෙකු භාවිත කරන විට දී ඔවුන් කලබල හා ඉතා නොසන්සුන්තාවයට පත්වීම පිළිබඳ වැඩිදුර සොයාබැලීම වැදගත් විය හැක.

මෙයට අමතරව ළමයෙකු අන්තර්ජාලය හරහා පෙළඹීමට ලක්වන බව හඳුනා ගැනීමට පහත ලක්ෂණ උපකාර විය හැක.

- අන්තර්ජාලය තුළ සිටින විටදී හා අනෙක් අවස්ථාවලදී ඔවුන්ගේ කාලය ගතකරන්නේ කෙසේද යන්න පිළිබඳව ඉතා රහසිගතව සිටීම.
- වයසින් ඉතා වැඩි පෙම්වතෙක් හෝ පෙම්වතියක් සිටීම.
- ඔවුන්ට ලැබුණු ආකාරය විස්තර කළ නොහැකි හෝ විස්තර නොකරන මුදල් හෝ ඇඳුම් පැළඳුම් සහ ජංගම දුරකථන වැනි ආගන්තුක දෑ පරිහරණය කිරීම.
- බාල වයසේදීම මත්පැන් පානය කිරීම හෝ මත් ද්‍රව්‍ය ගැනීම.
- අන්තර්ජාලය සහ ඔවුන්ගේ මෙවලම් භාවිතා කරන කාලය වෙනදාට වඩා අඩු හෝ වැඩිවීම.
- කලබලකාරී ස්වභාවයෙන් හෝ අවුල් වූ සිතැතිව සිටීම, ඉවත්වීම පසුබැසීම හෝ පීඩාවට පත්වීම.
- ලිංගිකමය හැසිරීම වයසට නොගැලපෙන භාෂාව හෝ ලිංගිකත්වය පිළිබඳ අදහස් හා දැනුමෙන් යුක්තව සිටීම.
- නිවසින් බැහැරව වැඩි කාලයක් ගත කිරීම හෝ කාලයක් තිස්සේ අතුරුදන් වී සිටීම.